# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත

---

**(සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වන දින)**

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1999 ඔක්තෝබර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

## 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත

## 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත

**(සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝම්බර් මස 07 වැනි දින)**

එල්.ඩී - ඕ. 54/98.

### 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ ප්‍රධාන ප්‍රඥප්තිය හෝ එවැනි වෙනත් යම් ලිඛිත නීතියක් මඟින් හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ හෝ සාදන ලද හෝ නියම කරන ලද හෝ බලය පවරන ලද යම් දැන්වීමක, ලිපියක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක "සමාජ ආරක්ෂණ මණ්ඩලය" යන යෙදුම දක්වා ඇති කවර හෝ අවස්ථාවකදී ඒ වෙනුවට " ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතුය.

*1996 අංක 17 දරණ පනත සහ අනෙකුත් ලිඛිත නීති සාමාන්‍ය ලෙස සංශෝධන කිරීම*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

*ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන වගන්තිය සංශෝධනය කිරීම*

" (2) අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂවරයන් අතරෙන් එක් අධ්‍යක්ෂවරයෙකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු අතර, වෙනත් අධ්‍යක්ෂවරයෙකු මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබිය හැකිය."

# 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන් වගන්තිය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"(4) මෙම පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ කාර්යය වනුයේ ධීවර හා කෘෂි කාර්මික අංශවල සේවයේ නියුතු අය හැර, වෙනත් ස්වංරැකියාවල නියුතු අය සඳහා ( මෙහි මින් මතු " යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්‍රාම

2 - H 4062 - 5,900 (99/08)

වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හා පහත දැක්වෙන අරමුණ ඇතිව එම යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම වේ :-

(අ) ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත්වූ විට එම කාලයේ දී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම ;

(ආ) ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් මියගිය විට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම ;

(ඇ) ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීයවල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම ;

(ඈ) ස්වයං රැකියාවල යෙදෙන ලෙස තරුණයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණ කිරීම ;

(ඉ) සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් ස්වයං රැකියාවල නියුත තැනැත්තන්ගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම.

## 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය එම වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඊඊ) මණ්ඩලයේ කර්තව්‍යයන්ට සමාන කර්තව්‍යයක් ඉටු කරන රාජ්‍ය ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම ; "

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 6 අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :-

6 අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

6 අ (1) අමාත්‍යවරයාගේ මතය අනුව, සමාජ ආරක්ෂණය, සමාජ සුභසාධනය, රක්ෂණය, ජීව ගණක තක්සේරුව, පරිපාලනය, මුදල් හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති හෝ හැකියාවන් පෙන්නුම් කර ඇති තැනැත්තන් අතරින් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරන ලබන) කාර්මික උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

කාර්මික උපදේශක කමිටුව

(2) මණ්ඩලයේ සභාපතිවරයා කමිටුවේ සභාපතිවරයා ද විය යුතුය.

(3) කමිටුවේ කර්තව්‍ය වනුයේ :-

(අ) යෝජනා ක්‍රමයේ පරිපාලනය හා කළමනාකරණයට අදාළව, මණ්ඩලය විසින් කමිටුව වෙත කළින් කළ යොමු කරනු ලැබිය හැකි කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම ;

(ආ) යෝජනා ක්‍රමය පරිපාලනය කරනුයේ හෝ කළමනාකරණය කරනුයේ යම් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ද, එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හො අදාළ යයි කමිටුව සලකන වෙනත් කරුණු පිළිබඳ මණ්ඩලයට උපදෙස් දීම ; සහ

(ඇ) මණ්ඩලය විසින් රීති සෑදීම පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම.

(4) අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිශ්‍රමික, මණ්ඩලයේ අරමුදලින් කමිටුවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකිය.

(7) ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උප වගන්තියේ "වයස අවුරුදු හැටට එළඹීමේදී" යන වචන වෙනුවට (1අ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව "වයස අවුරුදු හැටට එළඹීමේ දී" යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තිය (1) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් -

" (1අ) අවුරුදු 35 ට එළඹීමට පෙර දායක වීම ආරම්භ කළ වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයෙකු විසින් මානසික දුබලතාවකට පත් වී ඇතැයි සහතික කරනු ලැබූ දායකයෙකු, අවුරුදු 40 ට එළඹීමේ දී විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය"

(8) ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ " ඔහුගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයාට" යන වචන වෙනුවට "ඔහු විසින් මණ්ඩලයට භාර දෙනු ලැබූ නියමිත ආකෘති පත්‍රයේ නම් සඳහන් කරනු ලැබිය හැකි යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ගෙවනු ලැබිය යුතු හෝ ඒ වෙනුවට ඔහුගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපරුෂයාට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

(9) ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ 2 වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(ඇඇ) කවර හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ මහජන සංස්ථාවකින් මණ්ඩලයට පවරා දෙනු ලැබිය හැකි සියලුම මුදල් ; " සහ

(2) එම වගන්තියේ 3 වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

" (4) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ සියයක් විය හැකි අතර, එම මුදල පාර්ලිමේන්තු විසර්ජන පනතින් හෝ පාර්ලිමේන්තුවේ සම්මතයකින් අනුමත කිරීමෙන් වරින් වර වැඩිකළ හැක. එම ප්‍රාග්ධන ප්‍රමාණය මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ උපදේශය හා අමාත්‍ය තීරණය මත වාරික වශයෙන් ඒකබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය හැකි අතර, එම මුළු ගණන අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(5) 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය යටතට මණ්ඩලය ඇතුළත් කිරීමෙන් පසු මණ්ඩලයේ ලාභය සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය."

(10) ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 28 අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 අ අලුත් වගන්තිය සංශෝධනය කිරීම

28 අ (1) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් පොදු විධාන දෙනු ලැබිය හැකි අතර, එබඳු සෑම විධානයක්ම බලාත්මක කිරීම මණ්ඩලයේ කාර්ය විය යුතුය.

විධානය දීමට අමාත්‍යවරයාට හිමි බලය

(2) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව තොරතුරු සපයන මෙන් අමාත්‍යවරයා ලිඛිතව මණ්ඩලයට විධාන කළ හැකි අතර, එබඳු සෑම විධානයක්ම බලාත්මක කිරීම මණ්ඩලයේ යුතුකම විය යුතුය.

(11) මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.